ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

## ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාෂල් වී. ආර්. චෞද්රි මහතාගේ ශ්‍රී ලංකා සංචාරය - 2023 මැයි 2- 6

ශ්‍රී ලංකා ගුවන් හමුදපති එයාර් මාෂල් සුදර්ශන පතිරණ මහතාගේ ආරාධනයක් අනුව ඉන්දීය ගුවන් හමුද මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාෂල් වී. ආර්. චෞද්රි මහතා (PVSM, AVSM, VM, ADC) සිව් දින සිල සංචාරයක් සඳහා 2023 මැයි 1 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් ශ්‍රී ලංකාවට පැමිණි යේය. ශ්‍රී ලංකා ගුවන් හමුද මාණ්ඩලික ප්‍රධානී එයාර් වයිස් මාෂල් උදේනි රාජපක්ෂ මහතා සහ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා විසින් එතුමා උණුසුම් ලෙස පිළිගන්නා ලදී. එයාර් චීෆ් මාෂල් වී. ආර්. චෞද්රි මහතා සිය සංචාරය අතරතුර දී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හමු වීමට නියමිතය. එසේම එතුමා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම්තුමා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා සහ ත්‍රිවිධ හමුදපතිවරුන් ද හමු වනු ඇත.

2. මෙම සංචාරය මිත්‍රශීලී අසල්වැසි රාජ්‍යයන් දෙක අතර පවතින ශක්තිමත් සබඳතා සහ සමීප සහයෝගීතාවය සංකේතවක් කරයි. ඉන්දියාව ශ්‍රී ලංකාවට “අංක එකේ ප්‍රමුඛතාවය” ලබා දී ඇත. දෙරට ගුවන් හමුදවන් අතර තිබෙන ශක්තිමත් මිත්‍ර බැඳීම් පිළිඹිබු කරමින් එයාර් චීෆ් මාෂල් වී. ආර්. චෞද්රි මහතා ඉන්දීය රජය විසින් පිරිනමන ශ්‍රී ලංකා රුපියල් මිලියන 250ක ප්‍රදනයක් යටතේ ත්‍රිකුණාමලය ශ්‍රී ලංකා ගුවන් හමුද ඇකඩමියේ ඉදිකිරීමට නියමිත ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්ත්ව ශ්‍රවණාගාරයට මුල් ගල තබනු ඇත.

3. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා ඉන්දියාව දක්වන කැපවීමේ කොටසක් ලෙස ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානිතුමා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් යානාවල මෙහෙයුම් සූදානම සහතික කිරීම සඳහා A - 32 ප්‍රොපෙලර්ස් ද තිළිණ කරනු ඇත. එසේම එතුමා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ සහ චීන වරාය ගුවන් හමුදා ඇකඩමියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමඟ කතා බහක නිරත වනු ඇති අතර එහි දී ඔවුන් සඳහා පුහුණු ආධාර ද තිළිණ කරනු ඇත.

4. ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිතුමාගේ ආරාධනයක් අනුව 2021 පෙබරවාරි මාසයේ දී ඉන්දියානු ගුවන් හමුදා යානා 22ක බලඇණියක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70වන සංවත්සර සැමරුමට සහභාගී විය. එසේම, ඉන්දියානු ගුවන් හමුදාව 2020 මැයි මාසයේ දී ටොන් 12ක වෛද්‍ය සැපයුම් සහ 2021 නොවැම්බර් මාසයේ දී ටොන් 100ක නැනෝ පොහොර කඩිනමින් ශ්‍රී ලංකාවට සැපයීම සඳහා ගුවන් යානා ලබා දුන්නේය. ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානිතුමාගේ සංචාරය දෙරට අතර පවතින සබඳතා ශක්තිමත් කරනු ඇති අතර පොදු ආරක්ෂක අභියෝගයන් සාකච්ඡා කිරීමට සහ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන සංකල්පය අනුව ධාරිතා සහ ශක්‍යතා වර්ධනය සඳහා අවස්ථාවක් ලබා දෙනු ඇත.

***

කොළඹ
2023 මැයි 1